# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| දිනය Date | 2025.01.10 පැය 0945 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 40 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|

**පොලිස් විශේෂ කාර්‍ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු .**

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා කල්ලඩි කඳවුර**

2025.01.09 වන දින අළුයම් කාලයේ පොලිස් විශේෂ කාර්‍ය බලකා කල්ලඩි කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කාත්තන්කුඩි පොලිස් වසමේ තාලන්කුඩා ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 04 මිලි ග්‍රෑම් 600 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කාත්තන්කුඩි පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 49 ක් වන ආරියම්පති ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

කාත්තන්කුඩි පොලිසිය විසින් වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය හා කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා අරලගංවිල කඳවුර**

2025.01.09 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්‍ය බලකා අරලගංවිල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් දෙහිඅත්තකණ්ඩිය පොලිස් වසමේ ලිහිණියාගම ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 ක්, කේරළ ගංජා ග්‍රෑම් 240 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන දෙහිඅත්තකණ්ඩිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වූ දමනේවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

දෙහිඅත්තකණ්ඩිය පොලිසිය විසින් වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**03. අනවසරයෙන් ඇතුළු වී කැළෑ ප්‍රදේශයක් එළි පෙහෙළි කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා පුල්මුඩේ කඳවුර.**

2025.01.09 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්‍ය බලකා පුල්මුඩේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් පුල්මුඩේ පොලිස් වසමේ පොලිස් වසමේ වේලම්කුලම් ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අනවසරයෙන් ඇතුළු වී අක්කර ½ ක පමණ භූමි ප්‍රමාණයක කැළෑ ප්‍රදේශයක් එළි පෙහෙළි කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පුල්මුඩේ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර වැඩිදුර විමශර්න කටයුතු සඳහා පුල්මුඩේ පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 65 ක් වන පුල්මුඩේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

පුල්මුඩේ පොලිසිය විසින් වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 04. විදේශීය රටක නිෂ්පාදිත බලපත්‍ර නොමැතිව ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා හම්බන්තොට කඳවුර.

2025.01.09 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා හම්බන්තොට කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් හම්බන්තොට පොලිස් වසමේ බඳගිරිය ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර විදේශීය රටක නිෂ්පාදිත බලපත්‍ර නොමැතිව ගිනි අවියක් සන්තකයේ තබාගෙන සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන හම්බන්තොට පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 ක් වන හම්බන්තොට ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

හම්බන්තොට පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**